කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - 2016

(පළමු සෙමෙස්තර අවසාන)

ECN 1103 : ආර්ථික විද්‍යාවේ මූලධර්ම

කාලය පැ දෙකයි (2) පමණි

...ශ්නය ඇතුළු ව සහ පළමු කොටසින් හා දෙවන කොටසින් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ...නකට (3) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රස්ථාර යොදාගනිමින් පිළිතුරු විස්තර කරන්න.

පළමු (1) ප්‍රශ්නය සඳහා 50 ක් ද අනෙකුත් එක් එක් ප්‍රශ්න සඳහා 25 බැගින් ද වේ.
...යන්ත්‍ර භාවිත කළ හැකිය.

---

පහත දී ඇති ප්‍රශ්න අතුරින් ඕනෑම පහකට පිළිතුරු සපයන්න.

i. නිෂ්පාදන හැකියා වක්‍රයට අනුව සැමවිටකදීම එක භාණ්ඩයකින් නිෂ්පාදනය කරන ප්‍රමාණය ඉහළයත්ම අනිත් භාණ්ඩයෙන් කැපකළ යුතු ප්‍රමාණය වැඩි වේ. උත්තල වක්‍රයක් හා කල්පිත සංඛ්‍යාවන් යොදාගනිමින් මෙම ප්‍රකාශනය පෙන්නුම් කරන්න. කුමන උපකල්පනය (වක්‍රයේ ආකාරය) යොදා ගනිමින් ඔබට මෙම කියමන සාවද්‍ය බව පෙන්නුම් කළ හැකිද?

ii. සාමාන්‍යයෙන් ආර්ථික න්‍යායට අනුව සමාගම්වල අභිමතාර්ථය වන්නේ අඩුම වැටුපකට ශ්‍රමිකයන් සේවා නියුක්ත කර ගැනීමයි. එනෙත් කාර්යක්ෂමතා වැටුප් න්‍යාය මීට පටහැනිව තර්ක කරනුයේ සමාගම් වැටුප් ගෙවිය යුත්තේ සමතුලිත වැටුපට වඩා වැඩිවන ලෙසටයි. කාර්යක්ෂමතා වැටුප් ගෙවීමට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක මොනවාද?

iii. රජය නිෂ්පාදකයින්ට අමුද්‍රව්‍ය සඳහා සහනාධාරයක් ලබා දෙයි. මෙය පාරිභෝගික සුභ සාධනය ඉහළ දමයි. රූපසටහන් යොදාගනිමින් මෙම නිගමනය පැහැදිලි කරන්න.

iv. "ව්‍යවසායකයකු සැමවිටම අතිප්‍රාමාණික ලාභ උපයයි" මෙම නිගමනයෙහි ඇති වරද පෙන්වා දෙමින් මෙම වාක්‍ය නිවැරදි කරන්න. ව්‍යවසායකයාට නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ගෙවීමක් කළ යුත්තේ මන්දැයි සාධාරණීකරණය කරන්න.

v. ආර්ථිකයක චක්‍රිය ආදායම් ප්‍රවාහයට අනුව නිෂ්පාදන ප්‍රවාහ, ආදායම් ප්‍රවාහ සහ වියදම් ප්‍රවාහ මගින් විවිධ ප්‍රවේශයන් අනුව එකම දෙයක් මිනුම් කරනු ලබයි. විස්තර කරන්න.

vi. ආර්ථිකයක දළ දේශීය නිෂ්පාදිතය (ද:දෙ:නි:) ගණනය කරනු ලබන්නේ දළ නිමැවුම් සංකල්පය අනුව නොව එකතු කළ අගය නම් සංකල්පයට අනුව වේ. භාවිත කරමින් ගණනය කරයි. එසේ වන්නේ ඇයි යන්න පැහැදිලි කරන්න.

vii. ඇතැම්හු ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ නිමැවුමට හා සේවා නියුක්තිය පහළ යාම පිළිබඳව තම කණස්සල්ල ප්‍රකාශ කරති. කළකිරීමට පත්ව ඇත. මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේද? පැහැදිලි කරන්න.

viii. ලෝක ආර්ථිකය තුළ ඇති වූ මෑත කාලීන ආර්ථික කම්පනයන්ගෙන් එකක් ගෙන පැහැදිලි කර එය ශ්‍රී ලංකාවේ සාර්වආර්ථික කාර්යසාධනයට කළ බලපෑම් විස්තර කරන්න.

(එකකට ලකුණු 10 බැගින්)

**දෙවන කොටස : එක් ප්‍රශ්නයක් පමණක් තෝරන්න**

(අ) රටක ජාතික ගිණුම්කරණය ඇස්තමේන්තු කිරීමේ ප්‍රයෝජන මොනවාද? (ලකුණු 10)

(ආ) ශ්‍රී ලංකාවේ වාර්ෂික ජාතික ගිණුම්කරණයන් පිළිබඳ 2015 වර්ෂයේ ඇස්තමේන්තු පහත දක්වා ඇති අතර, මිල ගණන් රුපියල් බිලියන වලිනි,

| | | |
|---|---|---|
| 1 | රාජ්‍ය පරිභෝජනය | 985 |
| 2 | භාණ්ඩ හා සේවා අපනයන | 2295 |
| 3 | භාණ්ඩ හා සේවා ආනයන | 3125 |
| 4 | පෞද්ගලික පරිභෝජනය | 7666 |
| 5 | අනිකුත් රටවලින් ලැබෙනු ප්‍රාථමික ආදායම | 17 |
| 6 | අනිකුත් රටවලට ගෙවූ ප්‍රාථමික ආදායම | 268 |
| 7 | දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 3361 |
| 8 | පෞද්ගලික ඉතුරුම් | 2777 |
| 9 | රාජ්‍ය ඉතුරුම් | -246 |
| 10 | ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදනය | 8622 |

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. වෙළඳපල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික ආදායම ගණනය කරන්න.

ii. දේශීය ඉතුරුම් අනුපාතය, ජාතික ඉතුරුම් අනුපාතය සහ ආයෝජන අනුපාතය ගණනය කරන්න.

iii. 2015 වර්ෂයේ දෘ: දෙ: නි: අවධමනකයේ අගය කොපමණද? පසුගිය 2014 වර්ෂයේ දෘ: දෙ: නි: අවධමනකය 127 බිලියන ක් වූයේ නම්, දෘ:දෙ:නි: අවධමනකය මත පදනම් වූ උද්ධමන අනුපාතිකය කොපමණද?

(එකකට ලකුණු 5 බැගින්)

5)

(අ) කෙටිකලීන සමාහාර සැපයුම් (SRAS) වක්‍රය තිරස් හා දිගුකාලීන සමාහාර සැපයුම් (LRAS) වක්‍රය සිරස් රේඛාවන් වන්නේ ඇයි දැයි විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) පහත දැක්වෙන සිද්ධීන්ගෙන් කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් සමාහාර ඉල්ලුම් (AD) හා සැපයුම් (AS) ආකෘති යොදාගනිමින් විස්තර කරන්න.

i. රාජ්‍ය වියදමේ ඉහළයාමක්

ii. ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය

iii. ආනයනවල වැඩිවීමක්

(එකකට ලකුණු 5 බැගින්)

*************************************

… එක් ප්‍රශ්නයක් පමණක් තෝරන්න

(අ) රටක ජාතික ගිණුම්කරණය ඇස්තමේන්තු කිරීමේ ප්‍රයෝජන මොනවාද? (ලකුණු 10)

(ආ) ශ්‍රී ලංකාවේ වාර්ෂික ජාතික ගිණුම්කරණයන් පිළිබඳ 2015 වර්ෂයේ ඇස්තමේන්තු පහත දක්වා ඇති අතර, මිල ගණන් රුපියල් බිලියන වලනි,

| | | |
|---|---|---|
| 1 | රාජ්‍ය පරිභෝජනය | 985 |
| 2 | භාණ්ඩ හා සේවා අපනයන | 2295 |
| 3 | භාණ්ඩ හා සේවා ආනයන | 3125 |
| 4 | පෞද්ගලික පරිභෝජනය | 7666 |
| 5 | අනිකුත් රටවලින් ලැබෙනු ප්‍රාථමික ආදායම | 17 |
| 6 | අනිකුත් රටවලට ගෙවූ ප්‍රාථමික ආදායම | 268 |
| 7 | දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 3361 |
| 8 | පෞද්ගලික ඉතුරුම් | 2777 |
| 9 | රාජ්‍ය ඉතුරුම් | -246 |
| 10 | ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදනය | 8622 |

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වෙළඳපළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික ආදායම ගණනය කරන්න.

දේශීය ඉතුරුම් අනුපාතය, ජාතික ඉතුරුම් අනුපාතය සහ ආයෝජන අනුපාතය ගණනය කරන්න.

2015 වර්ෂයේ ද: දෙ: නි: අවධමනකයේ අගය කොපමණද? පසුගිය 2014 වර්ෂයේ ද: දෙ: නි: අවධමනකය 127 බිලියන ක් වූයේ නම්, ද:දෙ:නි: අවධමනකය මත පදනම් වූ උද්ධමන අනුපාතිකය කොපමණද?

(එකකට ලකුණු 5 බැගින්)

(අ) කෙටිකලින සමාහාර සැපයුම් (SRAS) වක්‍රය තිරස් හා දිගුකාලින සමාහාර සැපයුම් (LRAS) වක්‍රය සිරස් රේඛාවන් වන්නේ ඇයි දැයි විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) පහත දැක්වෙන සිද්ධීන්ගෙන් කෙටිකාලින හා දිගුකාලින බලපෑම් සමාහාර ඉල්ලුම් (AD) හා සැපයුම් (AS) ආකෘති යොදාගනිමින් විස්තර කරන්න.

i. රාජ්‍ය වියදමේ ඉහළයාමක්
ii. ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය
iii. ආනයනවල වැඩිවීමක්

(එකකට ලකුණු 5 බැගින්)

****************************************